අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 · +94112785818
info@moe.gov.lk · www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/21/04/03 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2025.05.30

**චක්‍රලේඛ අංක : 22 /2025**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
රජයේ පාසල්වල විදුහල්පතිවරුන්

**පාසල් ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා ලබා ගැනීමට තිළිණපත් නිකුත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග**

අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 2025 වර්ෂය සඳහා රජයේ පාසල්වල 6 ශ්‍රේණියෙන් ඉහළ වැඩිවියට පත් ශිෂ්‍යාවන්ට සනීපාරක්ෂක තුවා මිල දී ගැනීම සඳහා තිළිණපත් ලබා දෙනු ලැබේ. තිළිණපත් ශිෂ්‍යාවන්ට නිකුත් කිරීමේ දී මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි ක්‍රියා කරන ලෙස කාරුණිකව දන්වමි.

02. සනීපාරක්ෂක තුවා මිලදී ගැනීම සඳහා සියලු ප්‍රතිලාභීන් වෙත රු.720.00 බැගින් වූ කොටස් දෙකකින් සමන්විත රු.1440.00ක වටිනාකමක් සහිත තිළිණපතක් ලබා දෙනු ලැබේ. අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ 2023 සංඛ්‍යාලේඛන මත පදනම් ව තෝරාගත් රජයේ පාසල්වල ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යා තොරතුරු මත මෙම තිළිණපත් නිකුත් කිරීම සිදු කෙරෙන අතර මෙම තිළිණපත් අදාළ ශිෂ්‍යාවන් වෙත නොපමා ව නිකුත් කිරීමට විදුහල්පතිවරුන් විසින් කටයුතු කළ යුතු ය.

03. අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ගිවිසුම්ගත වී ඇති, ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලත් පහත ආයතන මඟින් පමණක් මෙම සනීපාරක්ෂක තුවා බෙදා දීම සිදු කරනු ලැබේ. එම ආයතන මඟින් පමණක් මෙම තිළිණපත සඳහා සනීපාරක්ෂක තුවා ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

| SLS ලාංඡනය ලබා ඇති නිෂ්පාදනය | ආයතනය | බලපත්‍ර අංකය | ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතරය | අවශෝෂණ ප්‍රමාණය |
|---|---|---|---|---|
| "ෆෙමස්" සන්නාමයේ තනි භාවිත සනීපාරක්ෂක තුවා | හේමාස් මැනුෆැක්චරින් පුද්ගලික සමාගම | 2806 | SLS 1732-2022 | 30ml |
| "EVA"සන්නාමයේ තනි භාවිත සනීපාරක්ෂක තුවා | අයි.සී.එල්.බ්‍රෑන්ඩ් පුද්ගලික සමාගම | 2800 | | |
| "Aarya+"සන්නාමය තනි භාවිත සනීපාරක්ෂක තුවා | ඩ්‍රීම් ලයිෆ් සයන්ස් පුද්ගලික සමාගම | 2608 | | |
| "සොසොෆ්ට්"සන්නාමයේ තනි භාවිත සනීපාරක්ෂක තුවා | ප්‍රයිම්ලයින් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම | 2904 | | |

04. මෙම තිළිණපත, විදුහල්පති භාරයේ තබා ගත යුතු පිළිපත, A කොටස සහ B කොටස ලෙස කොටස් තුනකින් සමන්විත වේ. එහි දළ ආකෘතිය ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

**5. තිළිණපත් බෙදාහැරීම**

5.1 අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ආරක්ෂිත මුද්‍රණ ක්‍රමවේද භාවිත කර මුද්‍රණය කරනු ලබන සනීපාරක්ෂක තුවා තිළිණපත්, තෝරාගත් පාසල් අනුව ඇසුරුම් කර කොට්ඨාස අධ්‍යාපන කාර්යාල අනුව වෙන් කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත SGSP 01 (EDU) ආකෘතිය (ඇමුණුම 02) මගින් බෙදා හරිනු ලැබේ.

5.2 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එම තිළිණපත් SGSP 01 (Zone) ආකෘතිය භාවිත කර (ඇමුණුම 03) අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත නොපමා ව බෙදාහැරිය යුතු ය.

5.3 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් මෙම තිළිණපත් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ප්‍රමාදයකින් තොරව බෙදා දිය යුතු ය. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් තම කොට්ඨාසයේ ඇති අදාළ පාසල්වලට බෙදා දිය යුතු තිළිණපත් සංඛ්‍යාව පරීක්ෂා කර භාර ගත යුතු ය. ඒ සඳහා SGSP 01 (DIV) ආකෘතිය භාවිත කෙරේ. (ඇමුණුම 04)

5.4 ඒ සඳහා පාසල් අනුව වෙන වෙන ම අසුරා පාර්සල් කර විදුහල්පතිවරුන් වෙත කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලබන සනීපාරක්ෂක තුවා තිළිණපත් අනුඅංක අනුව පරීක්ෂා කර භාරදීම / භාර ගැනීම සිදු කළ යුතු ය. මේ සඳහා SGSP 02 (SCH) ආකෘති භාවිත කළ යුතු ය. (ඇමුණුම 05)

**06. ශිෂ්‍යාවන්ට තිළිණපත් නිකුත් කිරීම.**

6.1 පාසලේ පන්ති නාම ලේඛනවල නම සඳහන් හය **ශ්‍රේණිය සහ ඉන් ඉහළ ශ්‍රේණිවල වැඩිවියට පත් ශිෂ්‍යාවන්ට පමණක්** තිළිණපත් නිකුත් කිරීම විදුහල්පතිවරුන්ගේ වගකීමකි. විදුහල්පතිවරයාට ලැබෙන සියලු ම තිළිණපත් විධිමත් ව හා නිවැරදි ව අදාළ ශිෂ්‍යාවන්ට ලබාදීම විනිවිදභාවයෙන් යුතුව ඉටු කිරීමට විදුහල්පතිවරයා බැඳී සිටින අතර, ඊට අදාළ සියලු ම ලේඛන විධිමත් ව සම්පූර්ණ කිරීමට ද කටයුතු කළ යුතු ය.

6.2 සියලු ම තිළිණපත්වල පසුපිට වෙන් කර ඇති ස්ථානයේ විදුහල්පතිගේ නිල මුද්‍රාව තැබීම අනිවාර්ය වේ.

6.3 නිල මුද්‍රාව තබන ලද තිළිණ පත් පන්තිභාර ගුරුවරුන් වෙත භාරදිය යුතු ය. පන්තිභාර ගුරුවරයා විසින් මෙම තිළිණපත් ලේඛනගත කර ඒ ඒ ශිෂ්‍යාවන්ගේ නම් සෑම තිළිණපතක ම සටහන් කළ යුතු අතර, නිවැරදි ව ශිෂ්‍යාවන් වෙත තිළිණපත් ලබා දී ඔවුන්ගේ අත්සන ලබා ගත යුතු ය. මේ සඳහා SGSP 03 ආකෘතිය භාවිත කළ යුතු ය. (ඇමුණුම 06)

6.4 කොටස් තුනකින් යුත් තිළිණපතෙහි A සහ B කොටස් දෙක ම එකවර අදාළ ශිෂ්‍යාවන් වෙත නිකුත් කළ යුතු ය. තිළිණපතෙහි A සහ B කොටස්වල වලංගු කාලය සඳහන් කර ඇති අතර, ඒ අනුව පළමුව A අක්ෂරය සහිත කොටසත් දෙවනුව B අක්ෂරය සහිත කොටසත් භාවිත කරන ලෙස ශිෂ්‍යාවන් දැනුවත් කළ යුතු ය.

6.5 තිළිණපතේ වලංගු කාල සීමාව A කොටස සඳහා 2025. 06.11 දින සිට 2025.08.05 දින දක්වා සහ B කොටස සඳහා 2025.09.10 දින සිට 2025. 11.05 දින දක්වා වශයෙන් සටහන් වන බැවින් එම කාල සීමාව තුළ සනීපාරක්ෂක තුවා ලබා ගන්නා ලෙස ශිෂ්‍යාවන් දැනුවත් කිරීමට විදුහල්පතිවරයා/ පන්තිභාර ගුරුවරුන් විසින් කටයුතු කළ යුතු ය.

6.6 තිළිණපතෙහි වටිනාකම සහ තිළිණපත් අංක පළුදු වුවහොත් එය අවලංගු වන බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු ය.

6.7 මෙම තිළිණපත නිකුත් කිරීමෙන් පසුව එකී අත්සන් ලේඛනය (SGSP 03) ඉදිරි විගණන කටයුතු සඳහා පාසලේ සුරක්ෂිත ව තබා ගත යුතු ය.

**07. තිළිණපත් මගින් සනීපාරක්ෂක තුවා මිලදී ගැනීම.**

**7.1** මෙම අමාත්‍යාංශය සමඟ ගිවිසුම්ගත වී ඇති අංක 3 හි සඳහන් ආයතන හතරෙහි නියෝජිතයන් තිළිණපත් සඳහා සනීපාරක්ෂක තුවා පැකට් ලබා දීමට පාසල වෙතට පැමිණෙනු ඇත. ශිෂ්‍යාවන්ට සනීපාරක්ෂක තුවා මිල දී ගත හැකි වන්නේ පාසලට පැමිණෙන මෙම ආයතනවල නියෝජිතයන් ගෙන් පමණි.

7.2 සිසුවියන්ගේ අභිමතය පරිදි කැමැති සනීපාරක්ෂක තුවා වර්ගයක් තෝරා ගැනීමට අවස්ථාව ලබා දිය යුතු හෙයින් ආයතන හතරෙහි ප්‍රාදේශීය නියෝජිතයන් සම්බන්ධ කර ගනිමින් එම ආයතන හතර ම පාසල වෙත ගෙන්වා ගැනීමට විදුහල්පති වරුන් විසින් කටයුතු කළ යුතු ය. එම නියෝජිතයන්ගේ පැමිණීම ඇමුණුම අංක 07 හි සටහන් කළ යුතු ය. පැමිණීම ප්‍රතික්ෂේප කරන හෝ නොපැමිණෙන හෝ ආයතන පිළිබඳ ඇමුණුම අංක 08 මඟින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කළ යුතු ය.

7.3 ආයතනවල නියෝජිතයන් සනීපාරක්ෂක තුවා ලබා දීම සඳහා පාසල වෙත පැමිණීමට විමසීම් කරන අවස්ථාවල දී ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම හා අපහසුතාවකින් තොර ව සනීපාරක්ෂක තුවා මිලදී ගැනීම සඳහා ශිෂ්‍යාවන්ට අවස්ථාව සලසා දීම විදුහල්පතිගේ වගකීමකි.

7.4 එක් එක් ආයතන පාසලට පැමිණෙන දින පිළිබඳ ව විදුහල්පති විසින් පෙර දැනුම්දීමක් සිදු කළ යුතු අතර සනීපාරක්ෂක තිළිණපත් හිමිකම ඇති සෑම ශිෂ්‍යාවකට ම සනීපාරක්ෂක තුවා මිල දී ගැනීමට ඇති අවස්ථාව මඟ නොහැරෙන පරිදි කටයුතු කිරීමට විදුහල්පතිවරුන් විසින් වග බලාගත යුතු වේ.

7.5 සනීපාරක්ෂක තුවා මිල දී ගැනීම සම්බන්ධයෙන් කිසිදු වෙළෙඳ නාමයක් හෝ ආයතනයක් හෝ ප්‍රවර්ධනය කිරීමෙන් වළකින ලෙස ද අවධාරණය කරමි.

7.6 එක් එක් ආයතනවල නියෝජිතයන්ට සනීපාරක්ෂක තුවා ලබා දීම සඳහා පාසලට ඇතුළු වීමේ අවසරය, අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය තිළිණපත් සඳහා සනීපාරක්ෂක තුවා නිකුත් කිරීම - **2025** පාසල්වලට ඇතුළු වීමේ අවසර පත මඟින් ලබා දී ඇත. මීට අමතර ව අදාළ ආයතනය මඟින් ද නියෝජිතයාගේ අනන්‍යතාව තහවුරු කිරීමේ ලේඛනයක්/අවසර පතක් නිකුත් කර ඇත.

**08. ශිෂ්‍යාවන් වෙත සනීපාරක්ෂක තුවා තිළිණපත් බෙදා හැරීමෙන් පසු වාර්තා කිරීම.**

**8.1 තිළිණපත් බෙදාහැරීමෙන් පසුව** SGSP 04 (ඇමුණුම 09) ආකෘතිය මඟින් විධිමත් පරිදි භාර දීමට කටයුතු කළ යුතු ය. එම තිළිණපත් ආපසු භාර දීමේ ලේඛනය (SGSP 04 ආකෘතිය) පිටපත් දෙකකින් යුතු ව සකසා ගත යුතු අතර එහි පිටපතක් පාසලේ සුරක්ෂිත ව තබා ගෙන ඉතිරි පිටපත අදාළ තිළිණපත් සමඟ භාරදිය යුතු ය.

8.2 තිළිණපත් ඉතිරි වී නොතිබුණ ද, ඒ බැව් SGSP 04 ආකෘතිය මඟින් දැන්විය යුතු ය. බෙදා දුන් සියලු ම තිළිණපත්වල මුල් කොටස පාසලේ සුරක්ෂිත ව තබා ගත යුතු ය.

09. තම කලාපයට අයත් සියලු ම පාසල්වලින් ලබා ගන්නා තිළිණපත් බෙදා දීමෙන් අනතුරු ව ලැබෙන වාර්තා ඇසුරෙන් අවසන් වාර්තාව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් සකස් කළ යුතු අතර SGSP 04 (ඇමුණුම 09) ආකෘතිය ඇසුරින් ඉතිරි තිළිණපත් ද සමඟ 2025.08.10 ට පෙර අතිරේක ලේකම් (ප්‍රසම්පාදන), 5 වන මහල, අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, 'ඉසුරුපාය', බත්තරමුල්ල යන ලිපිනයට භාරදීම ට/යොමු කිරීමට කටයුතු කළ යුතු ය.


10. කලාප අධ්‍යාපන කාර්යාලවලට ලැබුණු, පාසල්වල සනීපාරක්ෂක තුවා තිළිණපත් බෙදා දීමේ වාර්තා සම්බන්ධයෙන් සමීක්ෂණ කණ්ඩායමක් යොදවා අහඹු සමීක්ෂණයක් සිදු කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ වගකීමකි. ඒ සඳහා ගුරුවරුන් හෝ වෙනත් නිලධාරීන් හෝ යොදා ගැනීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත බලය පැවරේ. අදාළ සමීක්ෂණ වාර්තාවේ පිටපතක් අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත යොමු කළ යුතු ය.

11. රජයේ පාසල්වල 6 ශ්‍රේණියෙන් ඉහළ වැඩිවියට පත් සියලු ම ශිෂ්‍යාවන්ට සනීපාරක්ෂක තුවා මිලදී ගැනීමට අදාළ තිළිණපත් ලබා දීමට අවශ්‍ය කටයුතු නිවැරදි ව ඉටු කිරීම ඔබ සියලු දෙනාගේ ම වගකීම හා යුතුකම බව කාරුණික ව අවධාරණය කරමි.

මේ පිළිබඳ ඔබගෙන් ලැබෙන සහයෝගය අතිශය අගය කරමි.

නාලක කළුවැව
ලේකම්

ඇමුණුම 01


Ministry of Education, Higher Education and Vocational Education
A
B
1440/-
720/-
2025.09.10 - 2025.11.05
720/-
2025.06.11 - 2025.08.05

ඇමුණුම 02

SGSP 01(EDU)

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

.............................................

.............................................

**<u>පාසල් ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා මිල දී ගැනීමට තිළිණපත් නිකුත් කිරීම</u>**

**<u>2025 සනීපාරක්ෂක තුවා සඳහා තිළිණපත් බෙදාදීම</u>**

2025 වර්ෂය සඳහා ඔබ පළාතට අයත් කලාපයන්හි තෝරාගත් පාසල්වල ඉගෙනුම ලබන ශිෂ්‍යාවන්ට අදාළ සනීපාරක්ෂක තුවා තිළිණපත් සංඛ්‍යාව පහත පරිදි සපයනු ලැබේ.

| කලාපය | කොට්ඨාසය | තිළිණපත් සංඛ්‍යාව | තිළිණපත් අංකය | | වටිනාකම | |
|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | රු. | ශත |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

ඉහත සඳහන් තිළිණපත් සංඛ්‍යාව නිවැරදිව

භාර දුනිමි

.........................................

ලේකම් වෙනුවට
අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
නිල මුද්‍රාව
දිනය:-

භාර ගතිමි

.........................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
නිල මුද්‍රාව
දිනය:-

ඇමුණුම 03

SGSP 01(Zone)

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
......................................
......................................

**පාසල් ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා මිලදී ගැනීමට තිළිණපත් නිකුත් කිරීම**

2025 වර්ෂය සඳහා ඔබ කලාපයට අයත් තෝරාගත් පාසල්වල ඉගෙනුම ලබන ශිෂ්‍යාවන්ට අදාළ සනීපාරක්ෂක තුවා තිළිණපත් සංඛ්‍යාව පහත පරිදි සපයනු ලැබේ.

| කොට්ඨාසය | තිළිණපත් සංඛ්‍යාව | තිළිණපත් අංකය | | වටිනාකම |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | රු. ශත |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| එකතුව | | | | |

ඉහත සඳහන් තිළිණපත් සංඛ්‍යාව නිවැරදිව

භාර දුනිමි

......................................
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
නිල මුද්‍රාව
දිනය:-

භාර ගතිමි

......................................
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
නිල මුද්‍රාව
දිනය:-

ඇමුණුම 04

SGSP 01(DIV)

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ

..........................................

..........................................

## පාසල් ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා මිලදී ගැනීමට තිළිණපත් නිකුත් කිරීම

2025 වර්ෂය සඳහා ඔබ කොට්ඨාසයට අයත් තෝරාගත් පාසල්වල ඉගෙනුම ලබන ශිෂ්‍යාවන්ට අදාළ සනීපාරක්ෂක තුවා තිළිණපත් සංඛ්‍යාව පහත පරිදි සපයනු ලැබේ.

| පාසල | තිළිණපත් සංඛ්‍යාව | තිළිණපත් අංකය | | වටිනාකම |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | රු. ශත |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| එකතුව | | | | |

ඉහත සඳහන් තිළිණපත් ප්‍රමාණය නිවැරදිව

භාර දුනිමි

..........................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට

නිල මුද්‍රාව

දිනය:-

භාර ගතිමි

..........................................

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ

නිල මුද්‍රාව

දිනය:-

පිටපත්:

1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

ඇමුණුම 05

SGSP 02(SCH)

විදුහල්පති

.............................................

.............................................

**<u>පාසල් ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා මිලදී ගැනීමට තිළිණපත් නිකුත් කිරීම</u>**

2025 වර්ෂය සඳහා ඔබ පාසලට අදාළ සනීපාරක්ෂක තුවා තිළිණපත් පහත පරිදි සපයනු ලැබේ.

| පාසල | කොට්ඨාසය | තිළිණපත් සංඛ්‍යාව | තිළිණපත් අංකය | | වටිනාකම |
|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | රු. ශත |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

ඉහත සඳහන් තිළිණපත් සංඛ්‍යාව නිවැරදිව

භාර දුනිමි

.............................................
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ
නිල මුද්‍රාව
දිනය:-

භාර ගතිමි

.............................................
විදුහල්පති
නිල මුද්‍රාව
දිනය:-

පිටපත්:

1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

ඇමුණුම 06

SGSP 03

## 2025 පාසල් ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා මිලදී ගැනීමට තිළිණපත් නිකුත් කිරීම - පන්ති සාරාංශය

1. 1.1 පාසලේ නම :-
   1.2 සංගණන අංකය :-
2. 2.1 පාසල අයත් කලාපය :-
   2.2 පාසල අයත් කොට්ඨාසය :-
3. පන්තිය හා ශ්‍රේණිය ) :-

| අනු අංකය | ශිෂ්‍යාව ගේ නම | තිළිණපත් අංකය | වටිනාකම රු | භාර දුනිමි ගුරුභවතාගේ අත්සන | භාර ගතිමි සිසුවියගේ / භාරකරුගේ අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

..................................................... දිනය:-
ගුරුවරයාගේ නම හා අත්සන

..................................................... දිනය:-
විදුහල්පතිගේ නම හා අත්සන
නිල මුද්‍රාව

පිටපත් :-
1. කොට්ඨාස / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

## ඇමුණුම 07

පළාත:-
කලාපය:-
සංගණන අංකය:-
පාසලේ නම:-

| ආයතනයේ නම | පැමිණි දිනය | නියෝජිතයාගේ නම | අත්සන | පරිලෝකනය කළතිළිණපත් සංඛ්‍යාව | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

විදුහල්පති අත්සන

දිනය:-

ඇමුණුම 09

SGSP 04

## 2025 පාසල් ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා මිලදී ගැනීමට තිළිණපත් නිකුත් කිරීමෙන් පසු ඉතිරි තිළිණපත් ආපසු භාරදීම

අතිරේක ලේකම් (ප්‍රසම්පාදන)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

............................................................ විද්‍යාලේ සිටින ................. සනීපාරක්ෂක තුවා තිළිණපත් බෙදාහැරීමේ ලේඛනය අනුව ඉතිරි තිළිණපත් මේ සමඟ නිවැරදිව ආපසු භාර දෙමි.

| පන්තිය | ලද තිළිණපත් සංඛ්‍යාව | බෙදා හරින ලද තිළිණපත් සංඛ්‍යාව | ආපසු භාර දෙන තිළිණපත් සංඛ්‍යාව | වටිනාකම රු |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| එකතුව | | | | |

භාර දුනිමි

..........................................
විදුහල්පතිගේ නම හා අත්සන
නිල මුද්‍රාව
දිනය:-

භාර ගතිමි

..........................................
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ
නිල මුද්‍රාව
දිනය:-

භාර දුනිමි

..........................................
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ
නිල මුද්‍රාව
දිනය:-

භාර ගතිමි

..........................................
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
නිල මුද්‍රාව
දිනය:-

භාර දුනිමි

..........................................
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
නිල මුද්‍රාව
දිනය:-

භාර ගතිමි

..........................................
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
නිල මුද්‍රාව
දිනය:-

(පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කලාප කාර්යාල මගින් එවනු ලබන සියලුම අතිරික්ත තිළිණපත් එකතු කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙත විධිමත් පරිදි භාර දීමට කටයුතු කළ යුතුය)